**UNIVERSITY OF PERADENIYA**
**පේරාදෙණිය විශ්වවිද්‍යාලය**
**CENTRE FOR DISTANCE AND CONTINUING EDUCATION**
**දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය**

**දෙවන වසර ශාස්ත්‍රවේදී උපාධි පරීක්ෂණය (බාහිර - නව නිර්දේශය)**
**2020 අප්‍රේල්**
SECOND YEAR (200 LEVEL) EXAMINATION IN BACHELOR OF ARTS
(EXTERNAL - NEW SYLLABUS) APRIL 2020

**SUPE 205: බෞද්ධ මනෝවිද්‍යාව**

<u>ප්‍රශ්න පහකට පමණක්</u> පිළිතුරු සපයන්න.
(මෙම පත්‍රයට ඇතුළත් ප්‍රශ්න සංඛ්‍යාව 10 කි.) (කාලය - පැය තුනයි)

---

1. මූලික බුදුසමයෙහි දැක්වෙන විවරණ ආශ්‍රයෙන් මනසේ නෛසර්ගික ස්වභාව පිරික්සන්න.

2. මනෝවිද්‍යාවේ අභිප්‍රායක් වන අභ්‍යන්තර අන්දැකීම් විමර්ශනය කිරීමට බුදු සමයෙහි ඉගැන්වෙන "යොනිසො මනසිකාරය" භාවිතා කළ හැකි අයුරු පැහැදිලි කරන්න.

3. "චතුරාර්ය සත්‍යය මනෝවිද්‍යාත්මක පදනමකින් යුක්ත ඉගැන්වීමකි." මූලික දේශන ආශ්‍රයෙන් විමසන්න.

4. මනෝචිකිත්සා ක්‍රම සඳහා යොදාගත හැකි බෞද්ධ විධික්‍රම හඳුන්වා දෙන්න.

5. මනස විශ්ලේෂණය කිරීමේදී අභිධර්මයේ චිත්ත සහ චෛතසික විස්තර වලින් ලබාගත හැකි පිටුවහල පිරික්සන්න.

6. මෛත්‍රීභාවනාව මනෝවිද්‍යාතමක ප්‍රතිකාර ක්‍රමයක් වශයෙන් උපයෝගි කරගත හැකි අයුරු පැහැදිලි කරන්න.

අනෙක් පිටුවට ....

7. සමකාලීන සමාජය කෙරෙහි අවධානය යොමු කරමින් බෞද්ධ සමාජ මනෝවිද්‍යාත්මක ඉගැන්වීම්වල වැදගත්කම අගය කරන්න.

8. ත්‍රිශික්ෂා අභ්‍යාසයෙන් ආවේග පාලනය කළ හැකි අයුරු විස්තර කරන්න.

9. "රාග, ද්වේෂ, මෝහ යන අකුසල ධර්මවල වර්ධනයේ එක් ලක්ෂණයක් ලෙස භින්නෝන්මාදය හඳුනාගත හැකිය." මෙම නිගමනය කොතෙක්දුරට නිවැරදිදැයි යන්න විමසන්න.

10. අධ්‍යාපන මනෝවිද්‍යාවේ ප්‍රගතිය උදෙසා බුදුරජාණන් වහන්සේගේ දේශනා ක්‍රම වලින් ලබාගත හැකි මූලධර්ම හඳුන්වා දෙන්න.